නොදන්නා බව පෙනේ. රිතිය දනිතත් ඒ රිතිය රැකිය යුතු එකක් සේ නොසිතන නිසා එසේ ලියා ඇත්නම් මම නිහඬ වෙමි.

සැක සහිත අදහසක් කියන විටත් ඇසුවක් (අසා පු යමක්) කියන විටත් ඒ වැකියේ - කර්තෘ" අනුක්ත රූපයෙන් තැබීමත්, ක්‍රියාව අන්‍ය පුරුෂ බහු වචනයෙන් තැබීමත් පිළිගත් රිතියයි.

"ගිය කල දෙ - දහස්පන්සිය රජකු එති යි දියනා" (අවුරුදු දෙ-දහස් පන්සීයක් ගිය තැනේදී (ජයසේන) ලොවට නායක රජකු එතියි* මෙහි -රජකු එති" යන්න ප්‍රමාදයක් නොවේ.

"ඇදුර, (අප) තුටු නොවෙති යි (නොසිත) (ඇදුර) අප සිප් නොදතිතියි නොසිත (ඇදුර, තොප) වෙන සදතියි උනුමු (ඇදුර, තොප) වෙන ගායනා කරතියි (අපි) නොදත්තෙමු.

ගුන්තිල දා කවේ ඇති මේ ගී - කවේ පද හතරේ ඇති වැකි හතරම ඒ වියරන රිතියට අනුව ලිය වි ඇත. එහි ඇත්තේ (සංශය) සැක-යයි.

"අලියකු මිනිසකු මැරුහයි (මැරුණබව) මාමා කිය.
කොල්ලකු බල්ලකු නාවතියි (නාවන බව මාමා කියයි.

මේ දෙවැකිය ඇසුවක් (ඇසු යමක්) කීමට ලියා ඇත.

එහෙයින් ඉහත දෙ-වැකිය, "නායකයන් ....විමසති කියාය' කියාත්, "ජනමාද්‍ය ..... පෙල ගැසෙතියි කියාය" කියාත් ලිවීම යුතුය. එනත ඇත්තේ අවිනිශ්චිත බවකි.

"සිදු වුයේ ..... නාඩගම දැක රටට ... කොන් වි සිටිමටය" මේ වැකියේ අදහස තේරුම් ගැනීම සඳහා දෙ-තුන් වරක් ම මට එය කියවීමට සිදුවිය. ඊට හේතු වුයේ වැකිය මුලට තිබිය යුතු වු "රටට" වෙන; නැතක ගැන්නී සිටීමය. මම එය "රටට සිදු වුයේ ..... නාඩගම දැකත් ..... කොන් වි සිටිමටය" යනුවෙන් ගලපා තේරුම් ගත්තෙමි.

සිය බසේ "කර්" ධාතුවෙන් හැදෙන කර - කරන - කල ආදි පදත් ද - ම - ය - ල - ව - හ ආදි නිපාත පදත් පමනක් සංවෘතව කියවෙන අතර අන "අ" සොර හඬ මුලට ඇති අනෙක් හැම පද පදයක්ම "විවෘත" හඬින් කියවීම සිරිතයි. කතරගම තනි වචනයක් ලෙස කියවන විට මුලින් ඇති "ක" යන්න පමනක් විවෘත හඬ නංවයි. "තරගම" යන අකුරු හතරම කිය-වෙන්නේ සංවෘත "අ" හඬිනි. -කතර "ගම" පද දෙකක් සේ සලකා කියවන විට "ගම" යන පදයේ "ග" යන්න ද විවෘත "අ" හඬ නංවයි. ගහ - පහ පනහ වැනි පදවල අග "හ" යන්න නිසා හැම අකුරක්ම විවෘත "අ" හඬින් කියවේ. උහ - පුහ - ඉහ - නිහ - පළිහ - කෙහ - කොහ යන වචන වල අග "හ" යන්න සංවෘතව කියවෙන්වේ "හ" යන්නට මුලින් "අ" සොරයක් නැති නිසාය. ඒ රිතිය අනුව එ - කල - ද මෙ - කල - ද යන පද තුන -එකලද - මෙකලද " යනුවෙන් ලියා ඇති නිසා "කලද" යන අකුරු තුනම නංවන්නේ සංවෘත "අ" සොර හඬයි. කර - ලා, කඩා - ලා යන පද දොඩන බසේදී දිගුව කෙටි කොට කරලා: , කඩලා: යනුවෙන් කියවෙතත් එය ලියන බසට ගැනීම අමාරු වන්නේ සිය බසේ වචනයක අග අකුර සංවෘත ව ම කියවීම සිරිත නිසාය. (ඔබ) කරල (කො-න්ඩ) කඩල කියවන විදියට වැඩ කරල - දර කඩලා කියවීම වැරදිය. එහිසා එබඳු තැන් කරලඃ, කඩලඃ, ගහලඃ හෙලුවඃ ආවඃද, කෑවඃද, ඉව්වඃද යනුවෙහි මා ලියන්නේ.

"....රාජපක්ශ ගැන හෙතෙමට තිබු අවබෝදයේ තරම.." හේ තෙමේ - හෙතෙමේ - හෙතෙම, හෝ නොමෝ - ඕ නොමෝ නියම් වශයෙන් ම උක්ත රූපයේ. එය අනුක්තය සඳහා ලිවීම තහනම්ය. "හේ" යන්නේ අනුක්තය "ඔහු" ය, - ඔහු" (ඔව්හු) යන්නේ අනුක්තය "ඔව්න්" ය. " හෝ/ඕ" යන්නේ අනුක්තය "ඈ" ය. අද හේ - හෝ /ඕ අහෝසි වි ඒ වෙනුවට අනුක්ත රූපය වු ඔහු - ඈ පැමින ඇත. "හෙතෙමට - ඕ තොමට" පස් වැන්නේ ලමයකු අතින් වත් නො වන වරදකි.

එයසේන සුරින් ලියා ඇති - යන්තු මන්තු බෝදිපුජා" ලිපියේ ජනපාලකය හා බැඳි අදහස් ගැන මම නිහඬ වෙමි. ඔවින්ගේ ලියවිලි මා කියවන්නේ මා නොදත් බොහෝ ද ඔවින් දන්නා බව දන්නා නිසාය. ඔවින්ගේ ලිපි මට පමනක් නොව දැනුම වවා - වඩා ගැන්මට කැමති කාට උවත් වැඩවත් වෙතියි සිතමි.

ආගමි මුවාවෙන්, යන්තු මන්තු පුද පුජා මුවා-වෙන්, ඉර හඳ මුවාවෙන්, ග්‍රහ තාරකා මුවාවෙ-න් අසහනයට පත් වුවන්, මං මුලා වුවන් උලා කන, ඔවින් රවටා - බිට ගන්වා බඩ වියත රැක ගන්නා කපටයන් යෙහෙන් වැජඹෙන ලෝකය දකින විට මට ඇති වන්නේ කලකිරීමකි; අනකම්පාවකි; සංවේගයකි.

"අනේ මෙහෙමත් ..... කුන්" යනුවෙන් මට ම කියා ගෙන මගේ වැඩක් බලා ගැනීම අදහට ඉන බව දන්නා මම ඒ ගැන යමක් ලියන්නට උවත් පසු බාමි. මා ළංකාවේ පුවත් පත්වලින් කපා එකතු කර ගෙන ආ -යන්තු මන්තු පුද පුජා ගුරුකම්" දැන්වීම් සිය ගනනක් වරින වර බලමින් කියවමින් සතුටු වුයේ - තනියෙන් ගිනා වුයේ නිව්වු ඉතිරි රූ දැකවෙන මැගසින්ක් බලා සතුටු වන - තනිවෙන් සිනාසෙන කොලු ගැටයකු පරිද්දෙනි.

"සංගක්කාර" නම "සංඝ" මුල් වී හැඳුනු නමක් නොවේ. කොඩ්කාර, පළිහක්කාර, කසකාර, වෙඩික්කාර යන නම් වැලට අයත් "සංඝ (හක්) කාර" යන්න "සංගකාර" වී කියවීමේ පහසුව සඳහා " සංගක්කාර" වී ඇති බව පෙනේ.

දැන් දැන් ඒ පිළිලය කුංගුරුරටට ද බෝවී ඇති සැටි සිංහල පුවත් පත් බලන විට පෙනේ. බිඳිඳුන්ට නම් තැබීම ද දැන් ජාවාරමකි. මගේ හිතයෙක් දහසින් බැඳි පියල්ලක් පුදා තම පුතුට නමක් නිපදවා ගත්තේය. -නිවිනු නායක" යන තේරුමින් ඒ බිඳිදා -නිවින්" නම ලැබිය. මගේ තවත් හිතයකු එසේ නිපදවා ගත් නම් දෙකකි, -දෙවිමා සහ නෙලික්මා". ඒ නම් දෙකේ තේරුම ඔහුට දැන් මතක නැත. -උමා දෙවි" යන දෙපදය පද පෙරලියකින් දෙවිමා වී ඇති සේ දෙපද. -නෙලික්මා" යනු මට අපහසුයකි. කැතරින්, මාගරට් වැනි නම්වලත් -නෙලික්මා" නමේත් වෙනසක් මට නොපෙනේ.

ලඟ දී මෙල්බෝනයේ එක්තරා මහතෙක් තම මුනුපුරාට ඩ - ඩා - ඩැ - ඩෑ - ඩි - ඩී යන අකුරකින් පටන් ගන්නා නමක් හදා දෙන්නැයි මගෙන් ඉල්ලීමක් කලේය. ට - ඩ දෙයකුරින් පටන් ගන්නා නාම - ක්‍රියා - නිපාත පද අපේ බසේ ඇත්තේ කීපයක් පමනි. අංලත් එයට හේතුව මම නොදනිමි. සමහර -අංලත්" මව් පියෝ දරුවන්ට විසුලු නම් තබති. -අමනි" නම් මගේ සිසු දැරියගේ නම -අමානි" යනුවෙන් මම වෙනස් කෙලෙමි. -ඩිමන්" නමැති මගේ හිතයකු "දෙවිමන්" කෙනකු කිරීමට මට පුලුවන් විය.

ඉහත කී බිඳිදා ඉපදී තිබුනේ "ගිමිදිරි" පාන්දරය. ඔහුගේ මව්රට ඕස්ට්‍රේලියාවය. ඔහු සිංහල බාසාව උගනිත්දැයි කියන්නට මම නොදනිමි. අපේ රටේ දිළිප් ලා කිණෝරි ලා නිමිමි ලාත් පිළිප්ලා ඩෙවිඩ් / දාවිත් ලා වාලටි ලාත් ගැන සිතා මම ඒ බිඳිදාට -DEWSON ඩිවිසන් යෝජනා කෙලෙමි.

බොහෝ දෙමාපියන් තම දරුවන්ට අපූර්ව නමක් - හොඳ තේරුමක් ඇති නමක් සොයා ගැනීම සඳහා ගන්නා වෙහෙසත් දරන වියදමත් ගැන සිතන විට ඇති වන්නේ සංවේගයකි. "ගාමිනී" යන්නේ තේරුම (ගමනි - ගාමනි නොවේ) මම නොදනිමි. සුමංගල දිස්නරියේ කියන විදියට "ගාමිනී" යනු -යන සුලු" ය.

අපේ තාත්තා දර්මබන්දු (ධර්මබන්ධු) ගෙන් පටන් ගත් බන්දු (බන්ධු) පුතුන් හතර දෙනාටම යෙදීය. අන්තිමයා වු පද්මබන්ධු (තේරුම සූර්යා ය.) කිසිදු තේජසක් නැති අගිංසක තනිකඩයෙකි. අනුන්ට අතපාන දනපාලලා, රිලා මුනුනක් ඇති සිරිපාල ලා/ පියසේනලා, බුදුන්ට හිත නැති සුගතදසලා කීදෙනෙක් අප අතර සිටිද්ද?

බුද්ධ - සුගත - ජින - ගෞතම දස, ධර්මදස, සංඝදස යන නම් අපේ ඇසට, කනට හොඳට පුරුදුය. සුගත - ජින - ගෞතමපාල, ධර්මපාල නම් දෙකද එසේම පුරුදුය. බුදුන් පාලනය කල හැකි, දහම පාලනය කල හැකි අය සිටිතත් සඟුන් පාලනය කල හැකි -සංගපාල" කෙනකු මෙතෙක් පහල නොවුයේ ඇයි. "සංගක්කාර" නම "සංඝ" මුල් වී හැඳුනු නමක් නොවේ. කොඩ්කාර, පළිහක්කාර, කසකාර, වෙඩික්කාර යන නම් වැලට අයත් -සංඝ (හක්) කාර" යන්න " සංගකාර" වී කියවීමේ පහසුව සඳහා " සංගක්කාර" වී ඇති බව පෙනේ.

කෙනකුගේ නමක තිබිය යුත්තේ (ලියන) අතටත් (කියන) කටටත් අසන කනටත් පියවීම පහසුවීම යන අංග තුනයි.

අකුරු දෙකකින් සාම / සාමා, තේජ /තේජා - අකුරු තුනකින් සුමනා/සුමනා, නිපුන /නිපුනා අකුරු හතරකින් මංගල / මංගලා, උත්තර / උත්තරා වැනි නම් එයට නිදසුනි. බන්ඩා / බන්ඩාර යන නම්වල තේරුම අසන්නේ කවරෙ-ක්ද? දන්නේ කවරෙක්ද?

බන්ඩි ගොයම බන්ඩිරාල යන තැන්වල ඇත්තේ " බංඩ" යන තේරුමයි. ගෝමර / ගෝඹර නිසා ගෝඹරා / ගෝඹරි යන නම් ඇති විය. සුදු පෑ බන්ඩිය නිසා නුනුබන්ඩි / නුනුබන්ඩා ඇතිවිය. බැද්දෙගම -නවලලේ" එන වැදි නම් ඔබ දනිතියි සිතමි.

ඇත්තට ම මගේ නම කෙටි එකක් විනි නම්! සිංහල කටට නුනුරු බරහඬ ඇති (බැරෑඩි) - මහාප්‍රාන" අකුරු දෙකක් මගේ නමේ තිබීම මට වදයක් සේ සිතේ.

ධර්මලිංගම් / තරුමලිංගම් නම් මගේ මිතුරා මා ඇමතුවේ "තරුමපන්දු" කියාය්. සිංහල නොදත් මේ රටේ මිනිසුන් මගේ නම කියන්නට තටමන තැටමිල්ල ගැන සිතන විට සිනා නොවී සිටිය නොහැකිය. ඩි - හර්ම - ඩර්ම - ධාම (බැන්ධු / බැන්ඩු) යනුවෙන් ගොත ගසමින් ඔවින් මගේ නම කියන්නට උත්සාහ කලේ.

ලිපිය තවත් දික් කොට සන්නස අසහනයට පත් කිරීමට මම නොකැමැත්තෙමි. එහෙයින් අවසන් විසින් පියසේන සුරින්ගේ ලිපිය ගැන ලියමි.

"හොරට (බොරුවට) නිදා ගන්නා එකා කෙලමෝලෙන් ඇත්තත් අවදි නොවෙති"ය් යන කියමන කට කහනවඃ ට කියාපු එකක් නොවේ. තම නැන නුවනින් වැඩ ගන්නා, හිරු උවසැ (ළ මඟ - ළමඟ වන විදියට ළ ඇස - ළවැස හදා ගත්තෙමි. උපැස යන්න වියහරේ පවතී) නොගලවා ලොව බලන මිනිසුන්ට පියසේන සුරින්ගේ ලිපිය ගෝචර නොවේ. එබඳු ලිපි කියවා තම සිත් රිදවා ගැනීමට ඔවින් කැමති නැත.

ලෝකය ගෝලාකාර වස්තුවක් බව තේරුම් ගෙන, එහි සමකය ද අතුරු දෑ දින රේකාව ද ලකුනු කොට, එය අන්සක 360 කට බෙදා, එක් අන්සකයක් පසු කිරීමට එයට විනාඩි 4 ක් ගතවන බවත් සමකය වටා පොළොවේ දින / දුර කි.මි. 40,000 (මයිල 24,856) ක් බවත් ගැන බලා පැයකට මයිල 1000 කටත් වැඩි වේගයෙන් පොළොව කැරකෙන බවත් දැන ගෙන, රෑ කල වෙලාව බලා ගැනීමට ඔරලෝසුවක් (පෑ තැටියක්) බාවිතා කල දඹදිව පොරන රිසිවරන් නිපැයු නකත් සතර සිය පන මෙන් රකින මිනිසුන්ට එබඳු ලිපිවලින් වැඩක් නැත. මුනින් නැමු කලයට වතුර පිරවිය හැකි ජගතා කවරෙ-ක්ද?

42 වන පිටට

වි. ක. ධර්මබන්ධු මහතාට පිළිතුරක්

ජී. බී ගේ නිශ්ශබ්දතාවය හා නිසඳැස් පද්‍ය

"සන්නස" සැප්තැම්බර් කලාපයේ ජී.බී. ගේ නිශ්ශබ්දතාවය හා නිසඳැස් පද්‍ය නම් වි.ක. ධර්මබන්ධු මහතාගේ ලිපිය කියවූ මට මෙවැන්නක් ලියා එවීමට සිත්විය. එමෙන්ම එතුමා ලිපිය අවසානයේ යම් කෙනෙකුට තම අදහස් දැක්විය හැකිය යනුවෙන් කරන ලද සඳහනද මේ කෙරේ මා පෙළඹ වූ බව නමෝචිත්තියෙන් සඳහන් කළයුතුව ඇත.

ලිපිය ආරම්භයේදීම මහගමසේකරයන්ගේ දුකට කියන කවි සිපද අතරින් සිපද තුනක් තෝරා ලියා නිසඳැසක ආකාරයෙන් එක් සිපදයක පද බෙදා කරණු ලබන සඳහනෙන් පෙනී යනුයේ නිසඳැස් පද්‍යය පිළිබඳව එතුමා වැඩි රුචියක් නොදක්වන බවය. එහෙත් කාව්‍යය නිර්මාණයේදී වැදගත් වනුයේ හුදෙක් ආකෘතිය නොවේ. අනුභූතියයි. අත්දැකීමයි. මහගමසේකරයන් ද අවශ්‍ය තැන්වලදී සඳැස් ආකෘතිය තෝරා ගන්නද අවශ්‍ය තැන්වලදී නිසඳැස් ආකෘතියද තෝරාගනු දකිය හැකිය. සක්වාලිනීනි, හෙට-ඉරක් පායයි, මක්නිසාද යත්, රාජනිලක ලයනල්, හා ප්‍රියන්ත, බෝඩිම, නොමියමි, ප්‍රබුද්ධ යන කාව්‍ය සංග්‍රහ සියල්ලම පාගේ ලියා ඇත්තේ නිසඳැස් ආකෘතියෙනි. මහගමසේකරයන්ගේ කවිත්වයේ අනුමූලය ලෙස හඳුන්වාදිය හැකි සමකාලීන ආර්ථික, සාමාජික, සංස්කෘතික පරිසරය නිරූපණය කරණු ලැබූ ප්‍රබුද්ධද ලියා ඇත්තේ නිසඳැස් ආකෘතියෙනි. එහෙයින් කාව්‍ය නිර්මාණයේදී වැදගත්කොට සැලකිය යුත්තේ සඳැස්ද නිසඳැස්ද යන ආකෘතිය නොවේ. ආකෘතිය පහළවිය යුත්තේ වස්තු විෂයේ අන්තර්මූලයක් වශයෙනි.

අනතුරු ධර්මබන්දු මහතා නිශ්ශබ්දතාවය ගැන සිය අදහස් දක්වනු ලබයි. ධර්මබන්දු මහතාට විවේචනයට ඇති අයිතිය පිළිබඳ ප්‍රශ්ණයක් නැත. එහෙත් එසේ කිරීමේදී සාධාරණ විය යුතුය. අදානග්‍රාහි නොවිය යුතුය. පද්‍යපංතියේ එන නිහඬව හමන සුළඟින් යන්න විගුහ කරමින් මා දන්නා තරමින් නිහඬව හමන සුළඟක් නැතැයි පවසයි. මදන නළ / මදමරුවන් යන්නමින් හෝ හඬක් ඇසේ යැයි පවසයි. මෙහිදී පරිසරයේ නිහඬබව, තරුණයාගේ සිතෙහි ඇති වූ මානාභාවයන් කීමට මෙම යෙදුම යොදා ගැනීමේ ඇති වරද කුමක්ද ? මෙතුමාට අනුව ආදරය සුන්දර වරදකි වැනි වදන් වැරදි සහගතය.

හරතමුනිවරයාගේ පටන් විවිද පෙරදිග පඬිවරුන්ද ඇරිස-"ටෝටල්ගේ පටන් විවිධ අපරදිග පඬිවරුන්ද කවිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කොට ඇත. සිය සාහිත්‍ය දර්ශනයේදී විශ්වනාථයන් සඳහන් කළේ -වාක්‍යං රසාත්මකං කාව්‍යම්" රසවත් වැකිය කවිය වශයෙනි. ජගන්නාථයන් කවිය නිර්වචනය කළේ රමනීය අර්ථ ප්‍රතිපාදනය කරන ශබ්දධ්‍යය කාව්‍ය ලෙසිනි. -නිරුත්සාව ගලාඑන ප්‍රබල හැඟීම් කවියයි" යන විලියම් වර්ඩ්ස්වර්ත්ගේ ප්‍රකාශනයෙන් ද, කවිය යනු ස්මරණීය වාගලාශයයයි යන එච්. ඒ. ඕගන්ගේ කියමනෙන්ද කවිය යන්න කුමක්දැයි පැහැදිලි වේ.

ජී. බී. සේනානායකයන් ද මේ කර ඇත්තේ තමාලද අනුභූතිය චමත්කාර ජනක අයුරින් කවියට නැගීමකි. එහෙයින් නිහඬව හමන සුළඟක් නැතැයි කියමින් මේ දොඩනු ලබන වාගාලාසවල තේරුමක් තිබේද ? මෙම ගංතෙරේ වූ නිහඬබව කීමට එම යෙදුම කෙතරම් අපූරුද ?

අනතුරුව එතුමා අදහස් දක්වන්නේ මසෙකු හඬහඟා දැගලූ පුවත පිළිබඳවය. මෙයද කවියා යොදා ඇත්තේ තරුණයාගේ සිතෙහි ඇති වූ නොසන්සුන්තාවය ව්‍යංගයෙන් පැවසීමය. තියෙන දේ තියෙන ආකාරයෙන්ම කීම කවිය නොවේ. වාර්තාවකි. කාව්‍යයෙහි සාරවත් වූ අරුත වාච්‍යාර්ථයෙන් ප්‍රකාශ නොකොට ව්‍යංගාර්ථ වශයෙන් ප්‍රකාශ කරන විට විශේෂයෙන් සොබා සම්පන්න වනබව ආනන්දවර්ධනයන් ද ප්‍රකාශ කොට ඇත. කවියා මෙහිදී තම නිර්මාණ සඳහා භාවිතා කෙරෙන වචන සංයෝගයෙන් පසිඳුරන්ගේ මාර්ගයෙන් පාඨක මනසට පිවිස මනාසේ චිත්‍රයක් මැවීමේ කාර්යය මනාසේ ඉටුකරගනු ලබයි.

තවත් තැනක ධර්මබන්දු මහතා ඔවුන් දෙදෙනා උපමා කරණුයේ ලෙඩුන් දෙදෙනෙකුටය. තවත් තැනක ඔවුන් දක්-වනුයේ ලිංගික බෙලහීනතාවයෙන් පෙළෙන්නන් ලෙසිනි. නිශ්ශබ්දතාවය තුළින් කවියා අප ඉදිරියේ විශ්ලේෂණයට ලක්කරණු ලබන්නේ එවන් දරුණු ප්‍රේමවන්තයෙකු නොවේ. පිහිපාරකින් වෙඩි උන්ඩයකින් කෙළවරක් දකින ප්‍රේමයක කොටස්කරුවෙකු නොවේ. සංවේදී මනුෂ්‍යයෙකි. එහෙයිනි, ඔහු මෙසේ ප්‍රතිචාර දක්වනුයේ.....

"නිශ්ශබ්දතාවය දැඩිවිය
පෙදෙස වසාගෙන පැතුරුණු
නිහඬබවෙන් මිරිකුණු මම
අයගේ
රන්වන්
නිසල
මුහුණ දෙස බලා
කරබා ගතිමි "

ඩබ්. ජයවර්ධන

නැවුම් පුවත් හරවන් සතා බවා
දෙස් විදෙස් සාමූහික සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

රූපිත් රූපි සමග පැය තුනක් විනෝදය සහ නැළුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න